# බලශක්ති අමාත්‍යාංශය

# පුරප්පාඩු දැන්වීම

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## ඔබගේ සුනිත්‍ය බලශක්ති වෘත්තීමය ගවේෂණයේ ඇරඹුම අදයි....

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනය හා එක්වන්න. පෘථිවිය කාලගුණ විපර්යාස ව්‍යවසනයකින් ගලවා ගැනීමට බලශක්ති සංක්‍රාන්තිය මෙහෙයවන සුවිශේෂී වෘත්තීය එකමුතුවටයි මේ ආරාධනය....!

### ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා එක්වන්න

පහත සඳහන් තනතුර සඳහා සුදුසු සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. රජය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් යටතේ ස්ථිර සේවක සංඛ්‍යාවට පත්වීම් සිදු කරනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) - තනතුරු 01**

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන/ කළමනාකරණ/ ගිණුම්කරණ/ වාණිජ්‍ය උපාධියක්

**සමග**

රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක පශ්චාත් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ( පහත 1 හෝ 2)**

1. ඉහතින් සඳහන් කරන ලද බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ලබා තිබීම

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම සහ පිළිගත් ආයතනයකින් අදාළ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-1 -2025 : Rs. 91,690-2,480x10-3,450x15-168,240

**වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ට අදාළ නොවේ.)

**අයදුම් කළ යුතු ආකාරය:**

ඥාති සම්බන්ධතා නොමැති නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම, ලිපිනය සහ දුරකථන අංක සහිත ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, අදාළ සියලුම සහතිකවල සහතික කළ පිටපත් සහිතව 2025 නොවැම්බර් 07 වන දින හෝ ඊට පෙර **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අංක 80, සර් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිවිය යුතුය.

රජයේ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය,**
**අංක 80, සර් අර්නස්ට් ද සිල්වා මාවත,**
**කොළඹ 07.**
**2025.10.17**

**තිරසාර හා බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්**